**ශීර්ෂ 321 - නැගෙනහිර පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

පළාතේ ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂා තෘප්තිමත් කරන උසස් පාලන ක්‍රමයක් ඇති කිරීම.

### 1.2 මෙහෙවර

ජනතාවගේ වැඩිදියුණු වූ ජීවන තත්ත්වයක් උදෙසා කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබාදීම සඳහා සම්පත් එක්රැස් කිරීම හා ඒවා ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

නැගෙනහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 22,840.66 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 22,030.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 810.44 ක් හෙවත් සියයට 3.55 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2017 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 18,679.13 | 18,667.53 | 11.60 | 0.06 |
| මූලධන | 4,161.53 | 3,362.69 | 798.84 | 19.19 |
| **එකතුව** | **22,840.66** | **22,030.22** | **810.44** | **3.55** |

## 3. විගණන නිරීක්ෂණය

පාර්ලිමේන්තුව විසින් ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගණනය කරන ලද අතර ඒ අනුව උපයෝජනය කරන ලදී. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.